ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය
இலங்கையின் பிரதம அமைச்சர்
**Prime Minister of Sri Lanka**

## <u>ශෝක පණිවුඩය</u>

ලාංකේය සිනමාවේ දීප්තිමත් යුගයකට දායක වූ කලාකරුවන් එකිනෙකා අප අතරින් සමුගෙන යාම බලවත් සංවේගයට කරුණකි. ප්‍රවීණ රංගධරයකු, චිත්‍රපට අධ්‍යක්ෂවරයකු, නිෂ්පාදකවරයකු ආදී වශයෙන් විවිධ අංශවලින් හෙළ සිනමාවේ ඉදිරි ගමනට මහත් ශක්තියක් වූ රෝයි ද සිල්වා මහතාද එබඳු සුවිශේෂ කලාකරුවෙකි.

හැටේ දශකයේ රංගන ක්ෂේත්‍රයට පිවිස, රසික ප්‍රජාව අතර අතිශය ජනප්‍රිය වූ සිනමා කෘති රැසකට ස්වකීය ප්‍රතිභාපූර්ණ රංගනයෙන් දායක වූ ඔහු, තිරයේ වීරයාගේ භූමිකාව මෙන්ම දුෂ්ට, කවට ආදී වූ ඕනෑම චරිතයක් සාර්ථකව ප්‍රතිනිර්මාණය කරන්නට සමත්කම් දැක්වූ දක්ෂ රංගන ශිල්පියෙකි.

අසහාය රංගධරයකු මෙන්ම චිත්‍රපට නිර්මාණකරුවකුද වූ රෝයි චිත්‍රපට තිර රචනයට මෙන්ම පසුබිම් ගායනයටද එක් වී ඇත. 80 දශකයෙන් පසු සිනමාවේ පසුබැස්මක් පැවති සමයක ආදායම් වාර්තා තැබූ වාණිජ ධාරාවේ සිනමා කෘති නිර්මාණය කරමින් ලාංකේය සිනමාව නගාසිටුවීමට ඔහු තම දායකත්වය ලබාදුන්නේය.

සමස්ත ජීවිතය දේශීය සිනමාව වෙනුවෙන් කැප කළ ප්‍රවීණ කලාකරු රෝයි ද සිල්වා මහතාට ගෞරවනීය ආචාරය පුදකරමින්, ඔහුගේ දයාබර බිරිඳ ප්‍රවීණ රංගන ශිල්පිනී සුමනා අමරසිංහ මහත්මිය ඇතුළු පවුලේ සැමට මාගේ බලවත් සංවේගය පළකරමි.

**රනිල් වික්‍රමසිංහ**
**අග්‍රාමාත්‍ය**

2018 ජූලි 02